සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය<br>கண்டுபிடிப்பு சோதனை<br>Diagnostic Test | පැය 02 යි<br>02 மணி நேரம்<br>02 Hour |
| ඉතිහාසය I, II<br>வரலாறு I, II<br>History I, II | 07ශ්‍රේණිය<br>தரம் 07<br>Grade 07 |

1 කොටස ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

අංක 1-5 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. අනුරාධපුර යුගයේ වී වගා කළ කන්න තුනක් පිළිබඳ තොරතුරු සඳහන් මූලාශ්‍රය වන්නේ

(1) තෝනිගල සෙල්ලිපිය (2) බදුලු ටැම් ලිපිය

(3) මහාවංශය (4) පූජාවලිය

02. දුටුගැමුණු රජුගේ පුතාට "සාලිය" ලෙස නම් තැබුවේ එම කාලයේ කුමන වී වර්ගයක අස්වැන්න වැඩි වූ නිසාද?

(1) සුවඳල් (2) හීනටි (3) ඇල් වී (4) රත් ඇල්

03. රුවන්වැලිසෑය අලංකාර කිරීමට රෝමයෙන් පබළු ගෙන්වූ රජතුමා වන්නේ

(1) දුටුගැමුණු රජු (2) භාතිකාභය රජු

(3) මහසෙන් රජු (4) බුද්ධදාස රජු

04. දෙමාපියන්ට සැළකීමේ කාර්යය ඉතා ඉහළින්ම සිදු කළ රජු ලෙස මහාවංශයේ සඳහන් වන්නේ

(1) වලගම්බා රජු (2) 11 උපතිස්ස රජු

(3) අටවෙනි අග්ගබෝධි රජු (4) මහානාම රජු

05. පුරාණ ලංකාවේ නීතිරීති පිළිබඳ සඳහන් ක්‍රි.ව. 10 වන සියවසට අයත් සෙල් ලිපිය වන්නේ

(1) වේවැල්කැටිය ලිපිය (2) අඹගමුව ලිපිය

(3) වෙස්සගිරිය ලිපිය (4) මිහින්තලා ලිපිය

අංක 6-10 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

06. අතීතයේ පැවති වෙළෙඳ නගර මූලාශ්‍රවල ....................................... යනුවෙන් හඳුන්වා ඇත.

07. සූප ශාස්ත්‍රයෙහි දක්ෂ කාන්තාවන් ............................................ යනුවෙන් මූලාශ්‍රවල සඳහන් වේ.

08. පළමුවන විජයබාහු රජු කුඩා කාලයේදී ..................................... යන නමින් හැඳින්වීය.

09. පළමු පරාක්‍රමබාහු රජු හා දෙවන ගජබාහු රජු අතර ඇති වූ ගිවිසුම ............................................. සෙල් ලිපියේ සඳහන්ය.

10. සංස්කෘතික උරුම ආරක්ෂා කිරීම ....................................... සංවිධානයේ කාර්යභාරය වේ.

(මධුපාවිකා/යුනෙස්කෝ/කිත්ති/ සංගමු විහාර/ අඹගමුව/ නිගම/පට්ටන) අංක 11-15 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (√) ලකුණද වැරදි නම් (×) ලකුණද වරහන් තුළ යොදන්න.

11. මැටි ආශ්‍රිත නිශ්පාදන කළ ශිල්පීන් කුම්භකාර ලෙස හඳුන්වන ලදි. ( )

12. පාරම්පරික වෙස් මුහුණු නිර්මාණය සඳහා අම්බලන්ගොඩ ප්‍රදේශය ප්‍රසිද්ධියක් උසුලයි ( )

13. ශ්‍රී ලංකාවේ පැරණි මාතොට වරාය වර්තමානයේ හම්බන්තොට ලෙස හඳුන්වයි. ( )

14. මහසෙන් රජු "මින්නේරිය දෙවියන්" ලෙස ප්‍රචලිත විය. ( )

15. නිශ්ශංකමල්ල රජු කාලිංග වංශික රජ කෙනෙකි. ( )

අංක 16-20 දක්වා ප්‍රශ්න් වල "අ" තීරුවේ ප්‍රකාශයට ගැළපෙන පිළිතුර "ආ" තීරුවෙන් තෝරා යා කරන්න.

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| 16. 1 වන සේන රජුගේ පෙළපත වන්නේ | චීන මහා ප්‍රාකාරය |
| 17. ලෝක සංස්කෘතික උරුමයකි | ලන්දේසීන් |
| 18. අලුතින් ගිණි තබා සකස් කළ හේන හඳුන්වන්නේ | කාශ්‍යප රජු |
| 19. ගාලු කොටුව ආරක්ෂිත බලකොටුවක් ලෙස වඩා ශක්තිමත්ව ගොඩනැගුවේ | මානවම්ම |
| 20. සීගිරිය සිය රාජධානිය බවට පත්කර ගත්තේ | නවදැළිහේන |
| | වේවැල්කැටිය සෙල් ලිපිය |

(ලකුණු 2×20 =40)

## 11 කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01. (අ) පහත දැක්වෙන ස්ථාන හා ගංගා ඔබට සපයා ඇති ලංකා සිතියමේ ලකුණු කොට නම් කරන්න.

(1) අනුරාධපුරය (2) ත්‍රිකුණාමලය (3) යාපනය
(4) මහවැලි ගඟ (5) වලවේ ගඟ (ලකුණු 10)

(ආ) දී ඇති පින්තූර ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(1) පින්තූරයේ දැක්වෙන ඓතිහාසික ස්ථානය නම් කරන්න. (ලකුණු 01)

(11) එය ඉදි කළ රජතුමා කවුරුන්ද? (ලකුණු 02)

(111) එය පිහිටා ඇති නගරයේ නම ලියන්න. (ලකුණු 02)

(ඉ)



(1) මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද ? (ලකුණු 01)

(11) මෙහි දැක්වෙන සංකේත 2ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(111) මෙය හමු වී ඇති ප්‍රදේශය නම් කරන්න. (ලකුණු 02)

02. (1) ජේන් හැඳින්වීම සඳහා මූලාශ්‍රවල භාවිත කර ඇති යෙදුම් 2ක් ලියන්න. (ලකුණු 02)

(11) පහත සඳහන් වචනවල තේරුම ලියන්න.

(අ) ගොයම් කොළය (ආ) ගිනි යාතිකාව (ඇ) තවලම (ලකුණු 03)

(111) පැරණි ශ්‍රී ලංකාවේ වෙළෙඳාම සිදු වූ ආකාරය පිළිබඳ වාක්‍ය 5ක් ලියන්න. (ලකුණු 05)

03. (1) සෙල් ලිපිවල පහත සඳහන් යෙදුම් භාවිත කර ඇත්තේ කුමන රාජ්‍ය නිලධාරීන් හැඳින්වීම සඳහා දැයි ලියන්න.

(අ) අශ අදෙක (ආ) අති අදෙක (ලකුණු 02)

(11) අනුරාධපුර යුගයේදී මෙරට ක්‍රියාත්මක වූ නීති පද්ධතියේ ඇතුළත් නීති වර්ග 3ක් ලියන්න. (ලකුණු 03)

(111) බදුලු ටැම් ලිපියේ සඳහන් වෙළෙඳපොල පාලනයට අදාළ නීති රීති 3ක් විස්තර කරන්න. (ලකුණු 05)

04. (1) ශ්‍රී ලංකාවට බලපෑම් කළ දකුණු ඉන්දියානු රාජ්‍ය 2ක් නම් කරන්න. (ලකුණු 02)

(11) දකුණු ඉන්දියානු රාජ්‍ය සමග සබඳතා පැවැත්වූ ශ්‍රී ලාංකීය රජවරු 2ක් නම් කරන්න. (ලකුණු 03)

(111) අනුරාධපුර යුගයේ පැවති රජකම උරුම වීමේ සම්ප්‍රදායන් 2 උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

05. (1) පළමුවන විජයබාහු රජු පිළිබඳව තොරතුරු සඳහන් වන මූලාශ්‍ර 2ක් නම් කරන්න. (ලකුණු 02)

(11) පළමුවන විජයබාහු රජුගෙන් ඉටු වූ ශාසනික සේවාවන් 3ක් ලියා දක්වන්න. (ලකුණු 03)

(111) පළමුවන විජයබාහු රජුගේ චරිතයෙන් ඔබට ලබා ගත හැකි ආදර්ශ 3ක් ලියා පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. (1) පළමුවන පරාක්‍රමබාහු රජුගේ මව හා පියා නම් කරන්න. (ලකුණු 02)


(11) නිශ්ශංකමල්ල රජුට මුහුණ දීමට සිදු වූ අභියෝග 3ක් ලියා දක්වන්න (ලකුණු 03)

(111) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා පළමුවන පරාක්‍රමබාහු රජුගෙන් සිදු වූ සේවාවන් උදාහරණ 3ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

07. (1) ශ්‍රී ලංකාවේ ඇති ස්පෘශ්‍ය උරුමයන් හා අස්පෘශ්‍ය උරුමයන් එක බැගින් ලියන්න. (ලකුණු 02)

(11) අපේ සංස්කෘතික උරුම ආරක්ෂා කර ගැනීම සඳහා ඔබට ගත හැකි ක්‍රියා මාර්ග 3ක් ලියන්න. (ලකුණු 03)

(111) සීගිරිය සංස්කෘතික උරුමයක් ලෙස වැදගත් වීමට බලපාන හේතු 3ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)


N